www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කෙනඩි ඝාතනයේ 40 වන සංවත්සරය පිලිබඳ සිතුවිලි

## Reflections on the 40th anniversary of the Kennedy assassination

**ඩේවිඩ් නෝර්ත් හා බිල් වැන් විසිනි
2003 නොවැම්බර් 22**

දේශපාලන කුමන්ත්‍රනයක් තුලින් ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් ජනාධිපති තනතුරෙහි පිහිටුවීමට වසර 37කට පෙරාතුව, 1963 නොවැම්බර්හි දී, කුමන්ත්‍රනකාරී ක්‍රියාමාර්ග තුලින් කෙනෙකු ජනාධිපති තනතුරින් ඉවත් කල හැක්කේ කෙසේ ද යන්න ජෝන් එෆ්. කෙනඩි ඝාතනයෙන් ප්‍රදර්ශනය වී ඇත.

ඩලාස්හි දී කෙනඩි ඝාතනයෙන් වසර 40කට පසුව, ඝාතනය පිලිබඳ කරුනු තහවුරු කල යුතුව ඇති අතර එම සිද්ධීන් පිලිබඳ නිල වසයෙන් නිකුත් කරන ලද විස්තරය, පුලුල් වසයෙන් ගත් කල, වසං කිරීමක් ලෙස සැලකේ.

කෙනඩි ඝාතනය දේශපාලන අපරාධයකි. ඒ පිලිබඳ දේශපාලන පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ. වොරන් කොමිසම පිහිටුවන ලද්දේ මේ අතිමූලික මූලධර්මය ප්‍රතික්ෂේප කිරීම සඳහා ය. පසුගිය දශක හතර තුල සඟවන ලද්දේ එය යි.

බොහෝ වැදගත් අධිකරනමය ප්‍රශ්න අබිරහස් ලෙස සැඟවී තිබියදී ම, කෙනඩි, රාජ්‍ය කුමන්ත්‍රනයක ගොදුරක් වූ බවට, පාලක ප්‍රභූව තුල දැනට පවත්නා අර්බුද හා බෙදීම්වලින් වඩාත්ම සිත් කාවදින සාක්ෂි සපයයි. කුමන්ත්‍රනය දේශීය හා විදේශීය ප්‍රතිපත්තියෙහි ගමන් මගේ වෙනසක් ඇති කිරීමේ වෑයමක නිරත වූ පාලක සංස්ථාපිතයේ කොටසක් විසින් ඉලක්ක කොටගත් එකකි. මේ අපරාධයට එවකට දේශපාලන වාතාවරනය තුල ගැඹුරු මූලයන් හා දුරදිග දිවෙන ගම්‍යයන් පැවතුනි.

ජනමාධ්‍ය විසින් මේ ඝාතනයේ සංවත්සරය සලකුනු කොට ඇත්තේ, එක් අතකින්, "කැමිලෝගේ" පුරාවෘත්තය වන්දනය කෙරෙන භාවානුගත සත් ආදර්ශ චරිතාපදාන තුලින් හා අනික් අතින්, කෙනෙඩි, බෙහෙත් පෙතිවලට ඇබ්බැහි වූ ද සල්ලාලයෙකු වූ ද දේශපාලන අදක්ෂයෙක් පමනකැයි හංවඩු ගසා අවධානයෙන් ඉවත් කිරීමට උත්සුක වූ දක්ෂිනාංශික විචාරකයින්ගේ අවලාද හා චරිත ඝාතක අභ්‍යාස තුලින් ය.

එසේ වුව ද, අවශ්‍යව ඇත්තේ, පසු දැක්මෙන් ලත් අවබෝධයෙහි අගය ද අතැතිව, තම කාල වකවානුවෙහි දිවි ගෙවූ පුද්ගලයෙකු වසයෙන් කෙනඩි පිලිබඳ සන්සුන් සිහිබුද්ධියෙන් යුතු තක්සේරුවකි. කෙනඩි, ඇමරිකානු මූල්‍ය ප්‍රභූවේ නියෝජිතයෙකු ද කම්කරු පන්තියෙහි විරුද්ධවාදියෙකු ද, සමාජවාදයෙහි සවිඥානක සතුරකු ද වසයෙන් හඳුනා ගනිමින් දේශපාලනයෙහි පන්ති පදනම් කරගත් තක්සේරුවකින් මාක්ස්වාදීහු සිය කාර්ය අරඹති.

එසේ වුව ද අදට 40 වසරකට පෙරාතුව ඇති වූ සිද්ධිය, පුද්ගලයෙකුගේ ජීවිතය තුලින් ද, කම්කරු ජනයාගේ පුලුල් කොටස් මත එමගින් ඇති වූ බලපෑම තුලින් ද එහි ඛේදනීය ස්වරූපය පෙන්නුම් කල බව ද අපි වටහා ගතිමු.

කෙනඩිගේ ඉතා කෙටි කාලීන පාලන තන්ත්‍රය පිලිබඳව දිගටම පවතින වශීකරනය අහම්බයක් නො වේ. මේ පුද්ගලයා හා ඔහුගේ දේශපාලන වෘත්තීය තුලින් කේන්ද්‍රීය ස්වරූපයකින් ප්‍රකාශ වූයේ එම යුගයෙහි තියුනු සමාජ හා දේශපාලන විසංවාදයන් ය.

කෙනඩිගේ පෞද්ගලික ඉතිහාසය හා චරිතය පිලිබඳව මෑත වසර කිහිපය තුල බොහෝ දේ ලියවී ඇත. එය දෙබිඩි ජීවිතයක හැඟීමක් කෙනෙකු තුල ඇති කරයි. ඔහු පිලිබඳ පොදු ප්‍රතිරූපය වංශවත් පෙලැන්තියේ උපත ලත් සමාජ සේවකයෙකුගේ පුද්ගලාරෝපනයක් විය. ඔහු පියකරු බිරිඳක් හා බාල වියෙහි පසුවන ලමුන් සහිත ප්‍රියමනාප හා ක්‍රියාශීලි තරුන ජනාධිපතිවරයකු ලෙස පෙනුනි. ඔහුගේ පෞරුෂය තුල නිශ්චිතව සිත් ඇදගන්නා සුලු යමක් විය. ඔහුට තමාම විවේචනය කරගන්නා වූ හාස්‍යොත්පාදන හැකියාවක් සතුවිය. තම ජීවිතය තුලිනුත් දෙවැනි ලෝක සංග්‍රාමයෙහි වේදනාකාරී අත්දැකීම් තුලිනුත් ජනිත වූ පුද්ගලික දෛවවාදය පිලිබඳ හැඟීමක් ඔහු සතුවිය.

ඔහු පසුපස සැඟවී සිටියේ රෝගයෙන් පෙලුනු, වේදනා නාශක බෙහෙත් මත යැපුනු, මාෆියාව විසින් සපයන ලද ගනිකාවන් සමග නො ඉවසිලිවන්ත ලිංගික සුවය හඹාගිය, පුද්ගලයෙකි.

ඔහුගේ දේශපාලන දිවියෙහි ක්‍රියාත්මක වූයේ ද එවන් දෙබිඩි ලක්ෂනයකි. පරමාදර්ශී හැඟීමක් උත්පාදනය කරන දේශන පැවැත්වීමට ඔහු සමත් විය. එකල පැවති දේශපාලන නොමේරූ බව හා මුලාවන් තුල එය මුල් බැස ගෙන තිබූ බවට සැකයක් තිබිය නො හැක. සුලුපටු නො වන තරුනයින් සංඛ්‍යාවකට එය සමාජ අරගලවලට එලඹීමේ ආරම්භය සලකුනු කලේ ය. එම අරගලයන් දේශකයා කිසිදු අන්දමකින් පරිකල්පනය හෝ ඇලුම් නො කලා වූ දුරකට විහිදගිය ඒවා විය.

ඒ සමග ම, ලෝකය වටා කුරිරු ත්‍රස්ත විරෝධී ව්‍යාපාර හා ඝාතන සමග බැඳුනු බිය එලවන සුලු

කුමන්ත්‍රනවල ඔහු නිරත වුනි. එක්සත් ජනපද විදේශ ප්‍රත්පත්ති අරමුනු ක්‍රියාත්මක කරනු වස් අන්තවාදී කොමියුනිස්ට් විරෝධීන්, ඝාතකයින්, හා අපරාධකරුවන් සමග ඔහුගේ පාලන තන්ත්‍රය රහසිගතව ක්‍රියා කලේ ය. ඉහත කී බලවේග ඔහුගේ ආන්ඩුවේ ප්‍රතිපත්ති බොහොමයකට ද ප්‍රබල ලෙස විරුද්ධ වූහ. අවසන දී එම කොටස් මත විශ්වාසය තැබීමෙන් තමන්ගේ ම විනාශය ඔහු කැඳවා ගත්තේ ය.

එසේ වූ නමුදු, පසුගිය දශක හතරක කාලය තුල ඇමරිකානු ධනේශ්වර දේශපාලනය කෙතරම් දුරට පිරිහී ගොස් ඇත්දැයි දැක ගැනීමට පමනක් වුව ද, කෙනඩිගේ ඇතැම් දේශනවල අන්තර්ගතය සලකා බැලීම වටී. ප්‍රසිද්ධ දේශනයක් තුල සැබෑ සමාජ හා සදාචාරාත්මක අන්තර්ගතයක් තිබිය යුතු බවටත් එය මහ ජනයා වෙත ඉහල බුද්ධිමය තලයක ආයාචනයක් විය යුතු බවටත් විශ්වාස කල අන්තිම ඇමරිකානු ජනාධිපතිවරයා වූයේ කෙනඩි යයි කිව හැක.

සෝවියට් සංගමය හා පරිපූර්න න්‍යෂ්ටික අත්හදාබැලීමේ තහනමක් ගැන ද වායුගෝලීය න්‍යෂ්ටික පරීක්ෂන සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ තාවකාලික තහනමක් ගැන ද සාකච්ඡා ඇරඹීම නිවේදනය කරමින් ඇමරිකානු විශ්වවිද්‍යාලයේ ශ්‍රාවක සමූහයක් ඉදිරියේ 1963 ජුනි 10 දා කෙනඩි මෙසේ කියා සිටියේ ය:

"අප අතර වෙනස්කම් පිලිබඳ අප අන්ධ වී සිටිය යුතු නැත - එනමුදු, අපගේ පොදු අවශ්‍යතා ගැන ද එම වෙනස්කම් විසඳිය හැකි ක්‍රියාමාර්ග ගැන ද අපගේ ඍජු අවධානය යොමු කරමු. දැනට අප අතර වෙනස්කම් අවසන් කර ගැනීමට අපට හැකියාවක් නැත්නම්, යටත් පිරිසෙයින් විවිධත්වය සඳහා ලොව සුරක්ෂිත කර ගැනීමට අපට සහාය විය හැක. මන්ද යත්, අවසාන විග්‍රහයේ දී, අපගේ ඉතාමත් මූලික වූ පොදු සම්බන්ධය වන්නේ අප කවුරුත් මේ කුඩා ග්‍රහලෝකයෙහි වෙසෙන්නන් වීම යි. අප ආශ්වාස ප්‍රාශ්වාස කරන්නේ එකම වාතයයි. අප කවුරුත් අපගේ ලමුන් ඇල්මෙන් රැකබලා ගනිමු. තව ද, අප සියලු දෙනා ම මියයන්නෙමු."

පසු දින රූපවාහිනියෙන් ජාතිය අමතමින් ඇලබාමා විශ්වවිද්‍යාලයෙහි වාර්ගික බෙදීම අවසන් කිරීමේ නියෝග ක්‍රියාත්මක කරවීමට සංයුක්ත ජාතික ආරක්ෂක ඒකකවලට අන දී ඇති බව කෙනඩි නිවේදනය කලේ ය. වාර්ගික වෙන් කිරීම තහනම් කරන, සිවිල් අයිතීන් තහවුරු කෙරෙන, නීති සම්පාදනය පිලිබඳ සැලසුම් ද කෙනඩි අනාවරනය කලේ ය.

"රටේ කුමන අංශයෙහි උපත ලැබුව ද, සුදු ජාතික බිලිඳෙකුට සාපේක්ෂව, අද දින ඇමරිකාවේ උපත ලබන නීග්‍රෝ ජාතික ළදරුවෙකුට උසස් අධ්‍යාපනයට ඇති අවස්ථාව අඩකට පමන සීමා වේ. විශ්වවිද්‍යාල මට්ටමට සමත්වීමට ඇති අවස්ථාව තුනෙන් එකකි. වෘත්තීයකයෙකු වීමේ අවස්ථාව තුනෙන් එකකි. රැකියා විරහිතවීමේ අවස්ථාව දෙගුනයකි. වසරකට ඩොලර් 10,000ක් ඉපයීමේ අවස්ථාව හතෙන් පංගුවකට පමන සීමා වේ. ජීවිත අපේක්ෂාව වසර හතකින් කෙටි වේ. මුදල් ඉපයීමේ ශක්‍යතාව දෙකෙන් කොටසක් පමනි.

"ජනාධිපති ලින්කන් වහලුන් නිදහස් කිරීමෙන් අනතුරුව වසර 100ක පමාවීමක් සිදු වී ඇත. එනමුදු, ඔවුන්ගේ උරුමක්කාරයින්, ඔවුන්ගේ මුනුපුරන් මුලුමනින් ම නිදහස් වී නැත. අයුක්තියේ බැඳීම්වලින් ඔවුන් මෙතෙක් නිදහස් වී නැත. සමාජ හා ආර්ථික පීඩනයෙන් ඔවුන් මෙතෙක් නිදහස් වී නැත. සිය අපේක්ෂා හා පුරසාරම් සියල්ල කෙසේ වුව ද, සිය පුරවැසියන් නිදහස ලබන තුරු මේ රට මුලුමනින් ම නිදහස් නො වනු ඇත."

තව ද, තම ඝාතනයට මසකටත් අඩු කලකට පෙරාතුව මැසචුසෙට්ස්හි ඇම්හර්ස්ට් විශ්වවිද්‍යාලයෙහි 1963 ඔක්තෝබර් 26 දා පවත්වන ලද දේශනයක දී, ඇමරිකාව තුල සමාජ අසමානතාවය හා සමාජය තුල කලාකරුවාගේ භූමිකාව පිලිබඳ ප්‍රශ්නවලට කෙනඩි සිය අවධානය යොමු කලේ ය.

"වරප්‍රසාදය අප අතර පවතී. වරප්‍රසාදය සමග පැවරෙන්නේ වගකීම් ය. 1962 මාර්තුවල දී, උසස් අධ්‍යාපනය නො ලැබූ වයස අවුරුදු 18 වැඩි පුද්ගලයින් මුලු ශ්‍රම බලකායෙන් සියයට 46ක් විය. ඔවුන් රැකියා විරහිතයන්ගෙන් සියයට 64ක් විය. තව ද, 1958 වසරේ දී, එක්සත් ජනපදයෙහි පවුල්වලින් පහලම සියයට 20ට අත් වූයේ මුලු පුද්ගලික ආදායමෙන් සියයට 4 1/2කි. ඉහලම පවුල් සියයට 20ට සියයට 44 1/2ක් අයත් විය. මේ රට තුල උරුමයෙන් ලත් ධනය ඇතිවාක් මෙන් ම උරුමයෙන් ලත් දුප්පත්කම ද ඇත. මේ විශ්වවිද්‍යාලයෙහි හා මේ හා සමාන අනිකුත් විශ්වවිද්‍යාලයන්හි උපාධිධාරීන්ට ජීවිත ආරම්භයේ දී ඉදිරි කඩඉමක් හමුවේ. මෙම උපාධිධාරීන් එම සහජ කුසලතා, පුලුල් අනුකම්පාව, අවබෝධය හා දයාව යන එම ගුනාංගයන් මහා ජනරජයේ සේවාව සඳහා යලි කැපකිරීමට කැමැත්තක් දක්වතොත් මිස අපගේ ප්‍රජාතන්ත්‍රවාදය පදනම් වන පූර්ව කල්පනාවන් අනිවාර්යයෙන් ම වරදින සුලු ඒවා වනු ඇත..."

"එසේ වුව ද, යථාර්ථය පිලිබඳ තමාගේ පුද්ගලික දැක්ම අනුව කෙතරම් ප්‍රබල ලෙස කටයුතු කල ද, කලාකරුවා අක්‍රාන්තික සමාජයකට හා තම නිලබලය පාන රාජ්‍යයකට එරෙහි තනි මතයේ හා සංවේදිතාවේ අවසන් සටන්කරුවා වේ. මහා කලාකරුවා හුදෙකලා වූ පුද්ගලයෙකු වෙයි. ෆ්‍රොස්ට් කියා සිටි පරිදි ලෝකය සමග ඔහුට ඇත්තේ පෙම්වතෙකුගේ දබරයකි. යථාර්ථය පිලිබඳ ඔහුගේ සංජානනයන් පසුපස හඹායාමේ දී, තම කාලවකවානුවේ දියවැල්වලට එදිරිව යාත්‍රා කිරීමට ඔහුට නිතර සිදු වේ. මෙය ජනප්‍රිය භූමිකාවක් නො වේ. තම ජීවිත කාලය තුල රොබට් ෆ්‍රොස්ට් බොහෝ සෙයින් ගරුබුහුමන් ලැබුයේ නම්, ඒ ඔහු පලකල අඳුරු සත්‍යයන් නො සලකා හැරීමට බොහෝ දෙනා වැඩි මනාපයක් දැක් වූ නිසා ය.

"ඇතැම් අවස්ථාවල දී අපගේ මහා කලාකරුවන් අපගේ සමාජය දැඩි ලෙස ම විවේචනය කලේ නම්, ඒ ඕනැම සැබෑ කලාකරුවෙකු පෙලඹවිය යුතු යුක්තිය පිලිබඳ ඔවුන්ගේ සංවේදීතාව හා උත්සුකය තුලින් අප රට එහි ඉහලම විභවය අත්පත් කර නො ගන්නා බව

ඔහුට අවබෝධ වන නිසා ය."

ප්‍රමුඛ පෙලේ දේශපාලකයෙකු අද දින මේ අන්දමට කතා කරනු මෙනෙහි කර ගත හැකි ද? මේ වදන් බොහොමයක් කෙනඩි පාලන තන්ත්‍රය විසින් ඒකරාශි කරන ලද සුවිශේෂ කුසලතාවෙන් යුත් දේශන සකසන්නන් හා බුද්ධිමතුන් විසින් සකසන ලද ඒවා බවට පිලිගත යුතු ය. එනමුදු, අද දින ද ජෝර්ජ් ඩබ්ලිව්, බුෂ් විසින් උච්චාරනය කෙරෙන "එක්කෝ ඔබ අප සමග ය. නැත්නම්, ඔබ අපට එරෙහි ය" වැනි දේශපාලන ඌරු ඝෝෂාවන් කෙටුම්පත් කරන්නන් ද සිටිත්. වර්තමානයේ ජනාධිපතිකම අපේක්ෂා කරන ඩිමොක්‍රටික් පාක්ෂික දේශපාලන ලිලිපුට්ටන්ට (අඟුටුමිට්ටන්ට ද) දේශන සකසන්නෝ ද සිටිත්.

සමාජ සාධාරනය හා ප්‍රතිසංස්කරනය වෙනුවෙන් කල මේ පරමාදර්ශී ආයාචන ද ස්ථිර අඩිතාලමක් මත පදනම් විය. කෙනඩි යුගය අතිමූලික වසයෙන් නියෝජනය කලේ ඇමරිකානු ලිබරල්වාදයේ උච්ඡතම අවධිය යි.

1933 වසරේ ෆ්‍රැන්ක්ලින් ඩෙලානෝ රූස්වෙල්ට්ගේ පදවි ප්‍රාප්තිය හා කෙනඩි ඝාතනය අතර පසු වූ කාල සීමාව වසර 30ක් පමනකැයි සටහන් කර ගැනීම ද වටී. මෙය, කෙනඩි ඝාතනය හා අද දින වෙන් කරන කාල පරිච්ඡේදයට සැලකිය යුතු ලෙස අඩු වූ කාල පරිච්ඡේදයකි. 1930 ගනන්වල පිපිරී ගිය සමාජ ව්‍යාපාරයේ පීඩනය හමුවේ ද නිව්ඩීල් හෙවත් නව ගනුදෙනු ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කිරීමට ඇති වූ බලපෑම එවකට ද පැවතුනි. ඒඑෆ්එල්-සීඅයිඕ විසින් සංවිධානය කරන ලද මහා වෘත්තීය සමිති එවකට ද ඇමරිකානු දේශපාලන ජීවිතය තුල ප්‍රධාන බලවේගයක් නියෝජනය කලේ ය.

ඇමරිකානු ධනවාදය සිය ආර්ථික හා දේශපාලන බලයෙහි අග්‍රස්ථානයෙහි වැජඹුනි. එය දැවැන්ත සමාජ ධනයක් එක්රැස් කර ගෙන තිබුනි. ඒ සමග ම නිව්ඩීල් හෙවත් නව ගනුදෙනුව සමග බද්ධව පැවති සමාජ ප්‍රතිසංස්කරන ප්‍රතිපත්තිය දිගට ම ගෙන යෑම හා තවදුරටත් ගැඹුරු කිරීම සඳහා පුලුල් සහයෝගිතා පදනමක් ද පැවතුනි.

## නැගී එන විසංවාද හා ගැටුම්

එසේ වුව ද, කෙනඩි ප්‍රතිපත්ති තුල කොටු කර ගත නො හැකි වූ අති විශාල ආතතීන් හා විසංවාදයන් තුලින් මෙම අඩිතාලම් ම පුපුරා යැවීමට ඔන්න මෙන්න කියා තිබුනි. එක් අතකින්, කම්කරුවන්, කලු ජාතික ඇමරිකානුවන් හා බුද්ධිමතුන් අතර නව ගනුදෙනුවෙන් හා කෙනඩිගේ දේශනවලින් ජනිත කෙරුනු ප්‍රබෝධය ද, අනික් අතින්, මේ ප්‍රතිපත්ති පදනම් වූ ආර්ථික ක්‍රමය වන ධනවාදය ද අතර ගැඹුරු ආගාධයක් පැවතුනි.

නිෂ්පාදන බලවේගයන්ගේ පෞද්ගලික අයිතිය මත පදනම් වූ පද්ධතියක් තුල සැබෑ සමාජ ප්‍රතිසංස්කරන සඳහා දස ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ පොදු අභිලාෂයන් දරාගත නො හැකි ඒවා විය. 1963 වසර වන විටත්, ගැඹුරු වන ආර්ථික විසංවාදයන්ගේ පීඩනය යටතේ ඩොලරයේ ගරාවැටීම ඇරඹී තිබුනි. වැඩි වන අවාසි පුලුල් වන විදේශීය ආයෝජන හා වර්ධනය වන මිලිටරි වියදම් හේතු කොට ගෙන සමාජ ප්‍රතිසංස්කරන රඳා පැවති දේශීය සෞභාග්‍යයට යටින් වල කැපී ය.

මේ තත්ත්වයන් යටතේ කෙනඩි පාලන තන්ත්‍රයෙහි ප්‍රතිපත්තිම, ඇමරිකාවේ පාලක ප්‍රභූව තුල ප්‍රතිමල්ලව කන්ඩායම් අතර තියුනු විසංවාදයන්ගෙන් හා ප්‍රබල ගැටුම්වලින් සලකුනු කෙරින. එය පරස්පර විරෝධී සමාජ බලවේගයන් අතර තුලනයක් ඇති කිරීමට බලකෙරුනු ආන්ඩුවක් විය.

ඒ අනුව, 1962 වසරේ දී, වානේ කම්කරුවන් හා වානේ කර්මාන්තය අතර කොන්ත්‍රාත්තුවක් ඇති කර ගැනීමට මැදිහත්වීමෙන් අනතුරුව, ටොන් 1කට ඩොලර් 6 බැගින් මිල නැංවීම පිලිබඳව, කෙනඩි, එක්සත් ජනපද වානේ සමාගමට පහර දුන්නේ ය. එම සමාගමට එරෙහිව පොදු ව්‍යාපාරයක් දියත් කල ඔහු එම මිල නැංවීම අවලංගු කරන තෙක් සමාගමට එරෙහිව මහා ජූරි සභා සෝදිසියක් ඇරඹී ය. එකල ඔහු මෙසේ ප්‍රකාශ කලේ යː "සියලු ව්‍යාපාරිකයින් බැල්ලිගෙ පුතුන් යයි මගේ පියා සැමවිට ම මට පවසා තිබුනි. එනමුදු මේ වන තෙක් මම එය විශ්වාස නො කෙලෙමි." ඉන් පසුව, එම සමාගමට තම මිල ගනන් ඉහල නැංවීමට ඔහු ඉඩ දුනි.

1963 වසර වන විට, ස්ථාපිත දේශපාලනයෙහි සීමාවන් බොහෝ සෙයින් ඉක්මවා ගිය පොදු සමාජ ව්‍යාපාරයක් බවට පත් වූ සිවිල් අයිතිවාසිකම් සඳහා වූ අරගලයකට පාලන තන්ත්‍රය මුහුන දුනි. මෙය, කෙනඩිගේ ම පක්ෂය තුල පුපුරනසුලු ආතතීන් ජනිත කලේ ය. ඇලබාමාහි ජෝර්ජ් වොලස් හා මිසිසිපිහි රොස් බානට් වැනි ආන්ඩුකාරවරු, ෆෙඩරල් රජයට එරෙහිව කැරැල්ලකට සමාන ක්‍රියාවලියක් සංවිධානය කිරීමට තර්ජනය කලහ. අවසන දී, මේ ගැටුම ඩිමොක්‍රැටික් පාක්ෂිකයන් සීසීකඩ යැවී ය. තම පක්ෂය විසින් "ශක්තිමත් දකුන" ලෙස වර්නනා කල කොටසේ අවිවාදිත සහාය සහිතව අවසන් වරට ඡන්දයෙන් තේරී පත් වූනු ජනාධිපති කෙනඩි විය. ධවල මන්දිරය අල්ලාගත් ඊසාන දිගින් පැමිනි අන්තිම ලිබරල්වාදියා ද ඔහු විය.

දේශපාලන වසයෙන් ද, බුද්ධිමය වසයෙන් ද, ඇමරිකානු ලිබරල්වාදය පදනම් වූයේ ව්‍යාජයක් මත ය. 1930 ගනන්වල හා 1940 ගනන්වල සමාජ කැලඹීම ඉදිරියේ එය නොනැසී පැවතියේ දේශපාලන ප්‍රතිගාමිත්වය සමග ෆෝස්ටියානු ගනුදෙනුවක් ඇති කර ගැනීම තුලිනි. ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් දේශපාලනඥයින් විසින් එකසේ වැලඳ ගන්නා ලද එක්සත් ජනපද සංස්ථාපිතයෙහි එවකට පැවති මතවාදය ප්‍රතිකොමියුනිස්ට්වාදය බවට පත්ව තිබුනි.

කෙනඩිගේ පරමාදර්ශී දේශන පිටුපසින් පැවතියේ ලොව වටා මර්දනය හා ම්ලේච්ඡ ක්‍රියා හා බැඳුනු පරිනත වූ අධිරාජ්‍යවාදී බලවතෙකුගේ මතවාදය යි. මානව ජීවගුනය පිලිබඳ දේවගීතිකා ගයන අතර ම, කෙනඩි පාලන තන්ත්‍රයෙහි දෙපා ස්ථිරව ම පිහිටුවා තිබුනේ මඩ හා ලේ මත ය.

මෙය වූ කලී සාම හමුදාව හා ග්‍රීන් බෙරේස් හෙවත් කොල හිස්වැසුම් යන සංවිධාන දෙක ම පිහිටුවීම

සම්බන්ධයෙන් සිහිපත් කෙරෙන පාලන තන්ත්‍රයකි. මේ සංවිධාන දෙකම, විදේශයන්හි එක්සත් ජනපද උවමනාකම් ඉදිරියට ගෙනයන මෙවලම් වුව ද, එකක්, ලොව දුප්පතුන්ට ආධාර සැපයීම සඳහා ආත්ම පරිත්‍යාගයෙහි යෙදෙන ලෙස තරුන ඇමරිකානුවන් වෙත ආයාචනය ඉදිරිපත් කල අතර, අනික මේ දුප්පතුන්ම වොෂින්ටනයෙහි ප්‍රතිපත්තීන්ටත් එක්සත් ජනපද ව්‍යාපාරික අවශ්‍යතාවයන්ටත් අභියෝග එල්ල කල විට ඔවුන් මරා දැමීම සඳහා මේ තරුන ඇමරිකානුවන් කැඳවා ගත්හ.

කෙනඩිගේ පොදු ආයාචනයෙහි අන්තර්ගත වූ සමාජ ප්‍රගතිය හා පරමාදර්ශී අවධාරනය විප්ලවයේ තර්ජනයටත්, ලෝක ගෝලය වටා පීඩිත ජනතාව තුල සමාජවාදයේ හා කොමියුනිස්ට්වාදයේ ආකර්ශනය කෙරෙහි ඇමරිකානු පාලක පන්තියෙහි දුර දක්නා කොටස්වල ප්‍රතිචාරය විය.

එනමුදු, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මේ තර්ජනයට කෙසේ මුහුන දිය යුතු ද යන්න පාලක ප්‍රභුව තුල දිගට ම පැවතී ආ ගැටුමකට බඳුන් වූ විෂයයක් විය. අවසන දී එය කෙනඩිගේ ජීවිතය ද විනාශ කලේ ය.

පලමුවැනිව ඇති වූයේ කියුබාව පිලිබඳ ප්‍රශ්නය යි. කෙනඩි, තම පාලන තන්ත්‍රය ඇරඹූයේ, සීඅයිඒ සංවිධානය මගින් පුහුනු කරන ලද, රටින් පිටුවහල් වූ දක්ෂිනාංශිකයින්ගේ හමුදාවක් සමග කියුබාව ආක්‍රමනය කිරීමට, ඔහුගේ පූර්වගාමියා වූ ඩ්වයිට් ඩී. අයිසන්හවර් විසින් සූදානම් කරන ලද සැලසුමක් ක්‍රියාත්මක කරන ලෙස, දෙන ලද නියෝගයකිනි. බේ ඔෆ් පිග්ස්හි මේ බලකායන් අවමන් ගෙන දෙන පරාජයක් ලත් විට මේ ආක්‍රමනික බලකාය මුදවා ගැනීම කෙනඩි ප්‍රතික්ෂේප කලේ ය. එමගින් ඔහු පිටුවහලුන් හා සීඅයිඒ අනුග්‍රාහකයින් යන දෙගොල්ලගේ ම කෝපය ඇවිස්සී ය. මේ අන්ත පරාජයෙන් පසුව, මාෆියාවේ සහාය ඇතිව කියුබාවේ ෆිඩෙල් කස්ත්‍රෝ ඝාතනය කිරීම සඳහා, සීඅයිඒ සංවිධානය රහස්‍ය ව්‍යාපාරයක් දියත් කලේ ය.

එසේ වුව ද, කියුබාව ආක්‍රමනය නො කිරීමටත් තුර්කියෙන් සිය මිසයිල ඉවත් කර ගැනීමටත් වොෂින්ටනය දුන් ප්‍රතිඥාවට හුවමාරුවක් වසයෙන් තම මිසයිල ඉවත් කර ගැනීමට සෝවියට් සංගමය එකඟවූ ගනුදෙනුවකට ඇතුලුවෙමින්, කෙනඩි, 1962 වසරේ දී කියුබානු මිසයිල අර්බුදය අවසන් කලේ ය.

මේ ගනුදෙනුවත්, ඉන්පසු වර්ෂයෙහි මොස්කව් සමග සාකච්ඡා මගින් එකඟ වූ න්‍යෂ්ටික අත්හදා බැලීම් තහනම් කිරීමේ ගිවිසුමත්, යුදහමුදාව හා සීඅයිඒ සංවිධානය තුල මාෆියා සම්බන්ධතා ඇත්තවුන් ද කියුබානු පිටුවහලුන් ද අතර දිස්වූයේ අතිමූලික පාවාදීමක් ලෙසිනි.

සෝවියට් සංගමය කොටු කිරීමත්, න්‍යෂ්ටික සංහිඳියාවත්, මත පදනම් වූ කෙනඩිගේ ප්‍රතිපත්ති ඇමරිකානු පාලක පන්තියෙහි අති දක්ෂිනාංශික කොටස් අතර අභිශාපයක් විය. කෙනඩි, සමගි සම්මුතියක් ඇති කර ගැනීමට උත්සුක වූ අතර මේ අයවලුන්ට අවශ්‍ය වූයේ එක්සත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩුව විනාශ කිරීම සඳහා යුද්ධයකි. එක්සත් ජනපද රජයේ කේන්ද්‍රස්ථානය තුල මේ ප්‍රතිපත්තිය පිලිබඳ ඇති වූ බෙදීම්, ගැඹුරු වූ ද, අම්හිරි වූ ද, ඒවා විය.

අවසාන වසයෙන් එක්සත් ජනපදය වියට්නාමයෙහි දී දිග්ගැසුනු යුද්ධයකට අවතීර්න විය. තමා ඝාතනය වීමට තෙසතියකට පෙරාතුව වියට්නාමයෙහි ප්‍රබල නායකයා වූ න්ගෝ ඩින් ඩියම්ගේ ඝාතනයෙන් අවසන් වූ හමුදා කුමන්ත්‍රනයට, ඔහු මුහුන පෑවේ ය. මේ මිනීමැරුම සම්බන්ධයෙන් කෙනඩි සිය පෞද්ගලික භීතිය ප්‍රකාශ කලේ ය. එසේ මතුපිටින් පෙනීගිය ද කුමන්ත්‍රනය ක්‍රියාත්මක කිරීමට සිය අනුමැතිය දීම තුලින් ඔහු ඊට සෘජු වගකීම දැරූ බවට ඇති සාධකයෙන් මේ භීතිය උත්සන්න කෙරේ.

තම මරනය සිදුවන කාල වකවානුව වන විට වියට්නාමයෙහි එක්සත් ජනපද මැදිහත්වීම එක්කෝ තීව්‍ර කිරීමට හෝ එහි ඇම කපාහැරීමට ගත යුතු තීරනයකට එක්සත් ජනපද ජනාධිපති මුහුන දුනි. මේ දෙකෙන් කොයික වුවත් ඔහුගේ පාලන තන්ත්‍රයට විභව වසයෙන් මහා විපත්තිදායක ගම්‍යයන් පැවතුනි. කෙනෙකුට, පසුගිය වසර 40 තුල ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ විකාශනය කෙනඩි ඝාතනයේ බලපෑමට ආරෝපනය කල නො හැක. නපුරු ඉරනමකට ලක් වූ ලින්ඩන් ජොන්සන්ගේ පාලන තන්ත්‍රයට සිදුවූවාක් මෙන්, යලි තේරී පත්වූ කෙනඩි පාලන තන්ත්‍රයක් මත ද එක්සත් ජනපදය තුල සමාජ ගැටුම් ද, ලෝක ධනවාදය තුල විසංවාද ද, බලපෑම් එල්ල කල හැකිව තිබුනි.

එසේ වුව ද, කෙනඩි ඝාතනය දේශපාලන ක්‍රියාවක් විය. එහි අරමුන වූයේ එක්සත් ජනපද ආන්ඩුවේ ප්‍රතිපත්ති දකුනට හැරවීම ය. අරමුනු ඉටුකර ගැනීමෙහි ලා කුමන්ත්‍රනය සමත් විය. ඊට අමතරව, එමගින් ඝාතන දේශපාලනයෙහි කාල වකවානුවක් ඇරඹුනි. එමගින් ඩිමොක්‍රටික් පක්ෂයෙහි ලිබරල් අංශයෙහි හා සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයෙහි ඇතැම් ඉතාමත් කාර්යක්ෂම නායකයින් — මාටින් ලූතර් කිං හා රොබට් කෙනඩි — සඵල ලෙස ඉවත් කෙරින.

කෙනඩිගේ මරනය, නිව් ඩීල් හෙවත් නව ගනුදෙනුවෙන් මතුවුනු ඩිමොක්‍රටික් පක්ෂයෙහි නියම අවසානය සලකුනු කලේ ය. 1963 වසරෙන් පසුව, ලිබරල්වාදය අවසන් හුස්ම හෙලී ය. ප්‍රධාන පක්ෂ දෙකෙහි ම ප්‍රතිපත්ති වැඩි වැඩියෙන් විවෘත ප්‍රතිගාමීත්වය වෙත මාරුවීමක් සලකුනු කෙරිනි.

අද දින ඇමරිකානු දේශපාලන දිවිය, 1963 වසරේ ඝාතනයට සම්බන්ධ වූ හා, එයින් ප්‍රීතියට පත් වූ - බලවේගයන්ගේ ම ජයග්‍රහනය නිරූපනය කරයි. පාලක ප්‍රභුව තුල ක්‍රියාත්මක වූ සීඅයිඒ ඝාතකයින්, මැරවරයින් හා අපරාධකරුවන්ගෙන් සමන්විත දේශපාලන පාතාල ලෝකය සමග කෙනඩි පාලන තන්ත්‍රය තිරය පිටුපස කටයුතු කලේ ය. රාජ්‍ය බලයේ අවයවයන්ට විවෘතව හිමිකම් කීමට දැන් එම දේශපාලන පාතාල ලෝකය ඉදිරිපත් වී ඇත.